වයාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

81 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2007 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2007 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2007

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I
# வணிகக் கல்வியும் கணக்கீடும் I
# Business and Accounting Studies I

පැය එකයි
One hour

සැලකිය යුතුය :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවරුදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරට අදාල අංකය හා සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

---

01. මිනිස් වුවමනා පමණක් ඇතුළත් වන්නේ,
1. මුදල් හා ආහාර
2. ආහාර හා ඇඳුම්
3. ආහාර හා ආරක්ෂාව
4. භාණ්ඩ හා සේවා

02. ව්‍යාපාරයක කාර්යයක් නොවන්නේ,
1. නිෂ්පාදනය කිරීම
2. අලෙවිය හා ප්‍රවර්ධනය කිරීම
3. පර්යේෂණ හා සංවර්ධනය කිරීම
4. ව්‍යාපාරවලට අදාල නීති සැකසීම.

03. පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් “වෙළෙඳ පොළ” යන පදය වඩාත් හොඳින් පැහැදලි කරන ප්‍රකාශය තෝරන්න.
1. විවිධ භාණ්ඩ රාශියක් විකුණන සාප්පු සංකීර්ණයකි.
2. ගැණුම්කරුවන් රාශියක් ඇති ස්ථානයකි.
3. ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් මුණ ගැසෙන ස්ථානයකි.
4. සිල්ලර වෙළෙඳ කටයුතුවල නිරතවන වෙළෙඳ සැලකි.

04. පහසු භාණ්ඩයක් සහ සාප්පු භාණ්ඩයක් පිළිවෙලින් දැක්වෙන කාණ්ඩය තෝරන්න.
1. පුවත්පත හා රූපවාහිනිය.
2. පුවත්පත හා දන්තා ලේප
3. රූපවාහිනිය හා පාවහන්
4. සුවඳවිලවුන් හා සබන්

05. කාර්මික භාණ්ඩයක් හා පාරිභෝගික භාණ්ඩයක් අතර වෙනස රඳා පවතින්නේ,
1. භාණ්ඩවල වටිනාකම මතය.
2. ඉල්ලුම් ප්‍රමාණය හා ඉල්ලන වාර ගණන අනුව ය.
3. භාණ්ඩවල ජීවිත කාලය අනුව ය.
4. ඉහත කිසිවක් නොවේ.

06. ප්‍රජා පරිසරයට අයත් නොවන සාධකයක් වන්නේ,
1. ජනගහන වර්ධන අනුපාතය
2. ජනගහනයේ ප්‍රමාණය
3. වයස් ව්‍යුහය.
4. ආදායම් බෙදියාමේ විෂමතාවය.

07. ඒකක භාර අරමුදල් වල ආයෝජනය නොකරන ආයෝජන අවස්ථාව,
1. ඉතිරිකිරීම් හා ජංගම ගිණුම්
2. කොටස් හා ණයකර
3. භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්
4. ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්

08. නිතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,
1. හවුල් ව්‍යාපාර, තනි ව්‍යාපාර, සීමිත සමාගම්
2. සීමිත සමාගම්, සමුපකාර ව්‍යාපාර, හවුල් ව්‍යාපාර
3. සීමිත සමාගම්, රාජ්‍ය සංස්ථා, සමුපකාර ව්‍යාපාර.
4. හවුල් ව්‍යාපාර, තනි පුද්ගල ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර

09. රක්ෂිතයාගේ කැමැත්ත මත රක්ෂණ ඔප්පුවක වටිනාකම තීරණය කළ හැකි රක්ෂණ ඔප්පුව වන්නේ,
1. ගිනි රක්ෂණ ඔප්පුව | 2 ජීවිත රක්ෂණ ඔප්පුව
3. මුහුදු උවදුරු රක්ෂණ ඔප්පුව | 4. මෝටර් වාහන රක්ෂණ ඔප්පුව.

10. වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි චෙක්පත් වන්නේ,
1. විශේෂ රේඛණය සහිත චෙක්පත.
2. "ගනුදෙනු කළ නොහැක" යන්න ඇතුළත් රේඛණය සහිත චෙක්පත.
3. "ආදායකයාගේ ගිණුමට පමණයි" යන්න ඇතුළත් රේඛණය සහිත චෙක්පත.
4. සාමාන්‍ය රේඛණය සහිත චෙක්පත.

11. බලපත්‍රලාභි විශේෂිත බැංකුවක් වන්නේ,
1. මහජන බැංකුව | 2. සම්පත් බැංකුව
3. ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 4. මහ බැංකුව

12. හොඳ සන්නිවේදන මාධ්‍යයක අවශ්‍යයෙන්ම තිබිය යුතු වන්නේ,
1. පැහැදිලි බව | 2. ප්‍රතිපෝෂණය
3. ඝෝෂාව | 4. පණිවුඩය

13. අවදානම වඩාත්ම අඩු හා ආරක්ෂිත ආයෝජන මාර්ගය වන්නේ,
1. භාණ්ඩාගාර බැඳුම්කරයක ආයෝජනය කිරීම
2. මූල්‍ය සමාගමක ස්ථාවර තැන්පත් වල ආයෝජනය
3. වාණිජ බැංකුවක ඉතිරිකිරීමේ ගිණුමක ආයෝජනය කිරීම.
4. සීමිත සමාගමක කොටස් මිලට ගැනීම.

14. සීමිත පෞද්ගලික සමාගමකට පමණක් වන ප්‍රකාශය තෝරන්න.
1. 1982 සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ආරම්භ කළ යුතුය.
2. කොටස් ප්‍රසිද්ධියේ විකුණා ප්‍රාග්ධනය සොයා ගත නොහැකිය.
3. වගකීම සීමාසහිත වූ කොටස්කරුවන්ගෙන් සමන්විතය.
4. අධ්‍යක්ෂකවරු අවම වශයෙන් තිදෙනෙකුවත් සිටිය යුතුය.

15. නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
1. මගීන් හෝ භාණ්ඩ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙන යාම ප්‍රවාහනයයි.
2. ජීවිත හා දේපලවලට වන අලාභ හානි වීම ආරක්ෂා වීම රක්ෂණයයි.
3. පණිවුඩ, තොරතුරු හා අදහස් පුද්ගල හා ආයතන වලින් බැහැර දීම හා ලබා ගැනීම සන්නිවේදනයයි.
4. තොග රැස්කිරීම, ආරක්ෂා කිරීම හා නිකුත් කිරීමේ ක්‍රියාවලිය ගබඩාකරණයයි.

16. විවිධ සේවා සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි කිහිපයක් පහත දැක්වේ. ඊට අයත් නොවන්නේ කුමන ලිපිය ද?
1. ව්‍යවස්ථානුකූල ප්‍රකාශය
2. ලියාපදිංචිකිරීමේ අයදුම්පත්‍රය.
3. අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
4. ව්‍යාපාරය පිහිටුවීමේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක්.

**පහත සඳහන් ලියවිලි ආශ්‍රයෙන් 17,18,19 හා 20 යන ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

**A** ඉන්වොයිසිය **B** ණයවර ලිපිය **C** ඉන්ඩෙන්ටුව **D** හරපත
**E** ටෙන්ඩරය.

17. රාජ්‍ය ආයතනවලට භාණ්ඩ හා සේවා ලබා ගැනීමේදී බොහෝ විට මෙය භාවිත කරනු ලබයි.
1 A | 2 B | 3 C | 4 E

18. විකුණුම්කරු තමා විකුණන භාණ්ඩවල සියලු විස්තර ඇතළත් කර ගැණුම්කරුට යවන ලියවිල්ල.
1 A | 2 B | 3 C | 4 D

19. ආනයනකරු තමාට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ ඇණවුම් කරනු ලබන ලියවිල්ල වනුයේ.
1 A | 2 B | 3 C | 4 D

20. විකුණන ලද භාණ්ඩවල වටිනාකම අඩුවෙන් සටහන් වී ඇති අවස්ථාවක ගැනුම්කරුවන්ගෙන් ලැබිය යුතු මුදල දන්වා විකුණුම්කරු විසින් යවනු ලබන ලියවිල්ල වනුයේ,
1 A | 2 C | 3 D | 4 E

21. නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,
1. ප්‍රාග්ධනය - වත්කම් =වගකීම් | 2. වත්කම් - ප්‍රාග්ධනය =වගකීම්
3. වත්කම් =වගකීම් - ප්‍රාග්ධනය | 4. වත්කම් + ප්‍රාග්ධනය =වගකීම්

22. සීමාසහිත සම්පත් වඩාත් ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට
1. සියලුම ගෙවීම් වාර්තා කල යුතුය. 2. සියලුම ලැබීම් වාර්තා කළ යුතුය.
3. සියලුම් ලැබීම් හා ගෙවීම් වාර්තා කළ යුතුය. 4. සියලුම ගනුදෙනු පිළිබඳව වාර්තා තබා ගත යුතුය.

23. ගිණුම්කරණ වාර්තා පිළිබඳ ව්‍යාපාර හිමිකරුවන් උනන්දුවක් දක්වන්නේ,
1. එසේ කිරීමට ඔවුන්ට අයිතියක් ඇති නිසා ය.
2. රජයේ නීතිරීති වලට අනුව ඒ පිළිබඳ සොයා බැලිය යුතු නිසා ය.
3. ලාභදායිත්වය පිළිබඳ සොයා බැලීමට
4. සේවකයින්ගේ කාර්යක්ෂමතාවය සොයා බැලීමට.

24. සුළු මුදල් ගිණුමේ ශේෂය,
1. වත්කමකි. 2. වියදමකි 3. වගකීමකි. 4. හිමිකමකි.

25. අමල් පෙරේරාගෙන් ලැබිය යුතු රු. 10,000ක් ලබා ගැනීමේ දී රු. 1,000 ක් අඩු කර ඉතිරිය පමණක් ලබා ගැනීමට ව්‍යාපාරය එකඟ වුනි නම් එම අඩු කල මුදල
1. වෙළෙඳ වට්ටමකි. 2. මුදල් වට්ටමකි.
3. දුන් වට්ටමකි. 4. විකුණුම් හා බෙදාහැරීමේ වියදමකි.

**පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ අංක 26 හා අංක 27 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

ඇඟලුම් කර්මාන්ත ශාලාවක් ආශ්‍රිත මාසයක වියදම් පහත දැක්වේ.

| | |
|---|---|
| රෙදි සඳහා දැරූ වියදම | රු. 180,000 |
| යන්ත්‍ර ක්‍රියාත්මක කරන සේවිකාවන්ගේ වැටුප් | රු. 120,000 |
| කර්මාන්ත ශාලා කුලිය | රු .10,000 |
| මැසීමේ යන්ත්‍ර ක්ෂය වීම | රු. 8,000 |
| කර්මාන්ත ශාලා විදුලිය හා දුරකථන වියදම | රු. 4,000 |
| සුපරීක්ෂණ නිලධාරීන්ට ගෙවූ වැටුප් | රු. 25,000 |

26. මුළු සෘජු පිරිවැය කියද ?
1. රු. 300,000 2. රු. 310,000 3.. රු. 325,000 4. රු. 347,000

27. මුළු පොදුකාර්ය පිරිවැය කියද ?
1. රු. 167,000 2. රු. 320,000 3. රු. 47,000 4. රු. 227,000

28. පහත සඳහන් හර ශේෂයන් අතුරෙන් අසාමාන්‍යය අයිතමය කුමක් ද?
1. මෝටර් රථ ගිණුමේ රු. 150,000 ක හර ශේෂය
2. විකුණුම් වියදම් ගිණුමේ රු. 500 හර ශේෂය
3. ණයගැති ගිණුමේ රු. 100,000 ක හර ශේෂය
4. ණයහිමි ගිණුමේ රු. 2,000 ක හර ශේෂය

29. පහත අවස්ථා වලින් මුදල් වට්ටම් දෙනු ලබන අවස්ථාව තෝරන්න.
1. අත්පිට මුදලට ගෙවා භාණ්ඩ මිලදී ගැනීමේ දී.
2. උත්සව කාලයේ දී භාණ්ඩ මිලට ගැනීමේ දී
3. නියමිත දින මුදල් ගෙවීමට නොහැකි බව දන්වා වට්ටම් ඉල්ලා සිටින විට.
4. නම් කරන කාලය තුළ ණය මුදල් ගෙවීමේ දී.

30. නිවැරදි සමීකරණය තෝරන්න.
1. ප්‍රාථමික පිරිවැය + පොදුකාර්ය පිරිවැය =ඒකක මිල
2. ඒකක පිරිවැය + ලාභාන්තිකය =ඒකක මිල
3. සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය + ඒකක මිල =ලාභාන්තිකය
4. ඒකක මිල =මුළු පිරිවැය + පොදුකාර්ය පිරිවැය + වක්‍ර පිරිවැය.

31. පහත සඳහන් ඒවායින් වැරදි වැකිය තෝරන්න.
1. නිෂ්පාදන ඒකක ප්‍රමාණයට සාපේක්ෂව වැඩිවන පිරිවැය සෘජු පිරිවැය වේ.
2. නිෂ්පාදනය සඳහා අනිවාර්යෙන්ම යොදා ගන්නා ද්‍රව්‍ය සඳහා වැය වන වියදම් සෘජු පිරිවැයට අයත් වේ.
3. මුළු නිෂ්පාදන පිරිවැය නිෂ්පාදිත ඒකක ගණනින් බෙදීමෙන් ඒකක පිරිවැය සොයා ගත හැක.
4. ප්‍රාථමික පිරිවැයට, සියලුම පොදුකාර්ය පිරිවැය එකතු කිරීමෙන් මුළු නිෂ්පාදන පිරිවැය ලැබේ.

32. ලී බඩු වෙළෙඳ සැලක සිදුවූ පහත සඳහන් ගනුදෙනු වලින් පොදු ජ'නලෙය් ඇතුලත් කළ යුතු ගනුදෙනුව වන්නේ,
1. ලී බඩු තොගයක් සමන්ගෙන් ණයට ගැනීම.
2. පැරණි ලී බඩු තොගයක් ණයට විකිණීම
3. පාවිච්චි කළ මේසය සදුන්ට ණයට විකිණීම.
4. ලී බඩු තොගයක් නදීෂා වෙළෙඳ සැලට ණයට විකිණීම.

33. මුදල් පොතේ බැංකු තීරු සංශෝධනය කිරීමේ දී ඊට ඇතුළත් කළ හැකි ගනුදෙනුව තෝරන්න.
   1. තැන්පත් කළ නමුත් නිශ්කාශණය නොවූ චෙක්පත්
   2. ණයගැතියන් බැංකුවේ තැන්පත් කල මුදල් / චෙක්පත්
   3. බැංකුව සිදුකර ඇති වැරදි.
   4. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්

34. මූලික පොත් පිළිබඳව දී ඇති ප්‍රකාශයන්ගෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
   1. මුදල් පොත මූලික පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් ද වේ.
   2. විකුණුම් ජ'නලයේ සියලුම ණයට විකිණීමේ ගනුදෙනු සටහන් කෙරේ.
   3. අනෙකුත් විශේෂිත ජ'නල් වල සටහන් නොවන ගනුදෙනු පොදු ජ'නලයේ සටහන් කෙරේ.
   4. ණයට විකුණු භාණ්ඩ ආපසු එවීමේ දී "බැරපත" මූලාශ්‍ර ලේඛණයක් ලෙස භාවිත කෙරේ.

35. නිෂ්පාදනය කර බෙදාහරින ව්‍යාපාරයක භාණ්ඩ තොගයක විකුණුම් මිල රු. 80,000 කි. විකුණුම් මිල තීරණය කරන්නේ පිරිවැයට 25% ක ලාභයක් එකතු කිරීමෙනි. නිෂ්පාදනය කළ භාණ්ඩ ඒකක ප්‍රමාණය 8 000 ක් නම් ඒකකයක පිරිවැය වන්නේ,
   1. රු. 8 කි. 2. රු. 10 කි. 3. රු. 7.50 කි. 4. රු. 9 කි.

36. ණයහිමියකුට මුදල් ගෙවීමේ දී ලැබූ රු. 1,000ක වට්ටම ගිණුම් ගත කිරීමේ ද්විත්ව සටහන වන්නේ,
   1. මුදල් ගිණුම හර 1,000, ණයහිමි ගිණුම බැර 1,000
   2. ලද වට්ටම් ගිණුම හර 1,000, ණයහිමි ගිණුම බැර 1,000
   3. ලාභාලාභ ගිණුම හර 1,000, ණයහිමි ගිණුම බැර 1,000
   4. ණයහිමි ගිණුම හර 1,000, ලද වට්ටම් ගිණුම බැර 1,000

37. යන්ත්‍ර අලුත් වැඩියා වියදම රු. 1,500 ක් යන්ත්‍ර ගිණුමට හර කිරීම.
   1. ඌනතා දෝෂයකි. 2. අතිරික්තතා දෝෂයකි. 3. මූලධර්ම දෝෂයකි. 4. හිලව් දෝෂයකි.

38. ඉහත වැරදි නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වනුයේ,
   1. යන්ත්‍ර උපකරණ ගිණුම හර රු. 1,500
      යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ගිණුම බැර රු. 1,500
   2. යන්ත්‍ර උපකරණ ගිණුම හර රු. 3,000
      යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ගිණුම බැර රු. 3,000
   3. යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ගිණුම හර රු. 3,000
      යන්ත්‍ර උපකරණ ගිණුම බැර රු. 3,000
   4. යන්ත්‍ර අලුත් වැඩියා වියදම් ගිණුම හර රු. 1,500
      යන්ත්‍ර උපකරණ ගිණුම බැර රු. 1,500

39. ශේෂ පිරික්සුම,
   1. සියලුම හර හා බැර ශේෂ වල එකතුවකි.
   2. වර්ෂයක් අවසානයේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශණයකි.
   3. සමාන වීමෙන් ගිණුම් තැබීමේ නිවැරදිතාවය පෙන්වයි.
   4. ද්විත්ව සටහන් ක්‍රමයේ නිවැරදිතාවය පරීක්‍ෂා කරන ලේඛණයකි.

40. ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ ශේෂය,
   1. ව්‍යාපාරයේ බැංකු ජංගම ගිණුමේ ඉතිරි මුදලයි. 2. බැංකු ජංගම ගිණුමේ අයිරාවයි.
   3. ව්‍යාපාරයේ ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂයයි. 4. ඉතිරිකිරීමේ ගිණුමේ ණය ශේෂයයි.

**සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක**

**සිසිර කුමාර විසින් සම්පාදිත යි.**